IHRA
UNIVERSITY OF COLOMBO

110

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - I කොටස - 2016/2017

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2019 ජුනි)

## BLE 105 – නෛතික පරිසරය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(6) අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

(7) ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා පසු තීන්දු කෙරෙහි අවධානය යොමු කරන්න.

1) "ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ පවතින බහු විධතාවය නිසාම එය ඇතැම් විටක වර්ණවත් වන අතර තවත් විටක ගැටලුකාරී තත්වයන්ද ඉස්මතු කරයි."

ශ්‍රී ලංකාවේ පවතින විවිධ නීතීන් කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

2) ඉංග්‍රීසි නීතිය විවිධ ආකාරයන් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ නිති පද්ධතියට ප්‍රවේශ වී ඇත. එසේ ප්‍රවේශ වූ විවිධ ආකාර පිළිබඳව සාකච්ඡා කරමින්, ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ ඉංග්‍රීසි නීතියේ බලපෑම කෙසේදැයි සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

3) සැබෑ ලෙසටම රෝම - ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ පොදු නීතිය ලෙස කොතෙකුත් දුරකට පිළිගත හැකිද? විවේචනාත්මකව විමසන්න.

**(ලකුණු 20)**

4) උඩරට නීතිය කෙරෙහි ***විලියම්ස් ඒ රොබට්සන්*** (1886) 8 SCC 36 නඩු තීරණය මගින් කවර බලපෑමක් ඇති කරනු ලැබුවේද? විමසන්න.

**(ලකුණු 20)**

5) "ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකාවටම ආවේනික වූ මුස්ලිම් නීතියකි"

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකග වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(ලකුණු 20)**

6) අ) තේසවලමේ නීතිය තුළ සාකච්ඡා කරනු ලබන "වාසිකත්වය" යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) තේසවලමේ නීතියේ මූලාශ්‍ර මොනවාද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

7) අ) සමන් හා ජයනි සාමාන්‍යය විවාහ නීතිය යටතේ වර්ෂ 2005 ජනවාරි මස විවාහ වේ. ඔවුන්ට මෙම විවාහයෙන් දරුවන් දෙදෙනෙකු ද සිටී. වර්ෂ 2008 දී සමන්, ෆාතිමා නම් මුස්ලිම් තරුණියක සමඟ ප්‍රේම සම්බන්ධයක් ඇති කර ගනු ලබයි. පසුව සමන් වර්ෂ 2010 දී මුස්ලිම් ආගම වැළද ගනියි. මොහමඩ් ලෙබ්බේ යන නමින් ෆාතිමා සමඟ එම වර්ෂයේදීම මුස්ලිම් නීතිය යටතේ, නැවත වරක් විවාහ වේ. මෙම දෙවන විවාහය වලංගුද යන්න ජයනිට දැන ගැනීමට අවශ්‍යව ඇත. ජයනිට නෛතික උපදෙස් ලබා දෙන්න.

(ලකුණු 10)

ආ) රමණී වර්ෂ 2001දී උඩරට නීතිය යටතේ ලලිත් සමඟ දීග විවාහයකට එළඹේ. ඇයගේ පියා වන ජයතිස්සට පාරම්පරිකව උරුම වූ තේ අක්කර 05, කෝපි අක්කර 02 සහ ගම්මිරිස් අක්කර 01 ක ඉඩම් උඩරට පිහිටා ඇත. වර්ෂ 2002 දී හදිසි අනතුරකින් ලලිත් මිය යයි. නැවත රමණී උඩරට පිහිටි සිය මහගෙදර පදිංචියට පැමිණෙයි. ජයතිස්ස අන්තිම කැමති පත්‍රයක් රහිතව මිය යයි. රමණීට තම පියාගේ අන්තිම කැමති පත්‍ර රහිත දේපළ සඳහා අයිතිවාසිකම් හිමිද ? රමණීට නෛතික උපදෙස් ලබාදෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

8) වර්ෂ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රථම වරට අධිකරණය මගින් බලාත්මක කළ හැකි මූලික අයිතිවාසිකම් ඇතුළත් පරිච්ඡේදයක් හඳුන්වා දී ඇත. එලෙස හඳුන්වා දුන් මූලික අයිතිවාසිකම් සහ ඒවාට පවතින සීමාවන් මොනවාදැයි විග්‍රහ කරන්න.

**(ලකුණු 20)**

**************